# ශ්‍රී ලාංකීය ඉතිහාසය හා සංස්කෘතිය තුළ අලියා

අසිත මල්ලවආරච්චි *

**හැඳින්වීම**

ශ්‍රී ලාංකීය සම්ප්‍රදාය හා ආගමික කටයුතුවලදී යොදාගන්නා සතුන් අතර අලියාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එය ශ්‍රී ලාංකීය රජ දවස දක්වාත් ඇතැම් විට ඉන් එපිටටත් දිවයයි. පැරණි සිංහල රජවරුන් අලි හා ඇතුන් හීලෑ කර විවිධ රැකියාවන් සහ සේවාවන් සඳහා යොදාගත් බව පැරණි පොත පත සඳහන් කරයි. ඇතැම් අවස්ථාවලදි රාජතාන්ත්‍රික ගනුදෙනු හා සුහදතාවය වර්ධනය කරගැනීම වෙනුවෙන් අලි ඇතුන් හුවමාරු කරගත් බවට ද සාක්ෂි ඇත. එය වර්තමානය තුළ ද සිදු වේ.



**අලියා යනු ?**

ක්ෂීරපායි සත්ත්ව ලෝකය තුළ ගොඩබිම ජීවත්වන විශාලතම ශරීරය හිමි සත්ත්වයා වන්නේ අලියා ය. පෘථිවිය මත දැනට ජීවත්වන සතුන් අතරින් ශරීර විශාලත්වයෙන් අලියා දෙවැනි වන්නේ මුහුදේ වෙසෙන තල්මසාට පමණි. ඉංග්‍රීසි භාෂාවෙන් *Elephant* ලෙස හඳුන්වන අලියා අයත්වන්නේ *Probosidea* ගෝත්‍රයටය. ලෝකය තුළ දැනට ජීවත්වන අලි ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්,




**1. ආසියානු අලියා (Asian Elephant)**

2. **අප්‍රිකානු අලියා (African Elephant)**

ආසියානු අලියා තවත් අනු වර්ග තුනකට බෙදා දැකිවිය හැකිය. එනම්

- ඉන්දියානු අලියා
- සුමාත්‍රානු අලියා
- ශ්‍රී ලංකානු අලියා

බැලූ බැල්මටම මෙම තුන් වර්ගය තුළ ප්‍රබල වෙනස්කමක් නොමැත.

---

* **අසිත මල්ලවආරච්චි, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.**

- අප්‍රිකානු වනාන්තර අලියා
- අප්‍රිකානු සැවනා අලියා



ඉන්දියානු අලියා



ශ්‍රී ලංකානු අලියා



සුමාත්‍රානු අලියා



අප්‍රිකානු සැවනා අලියා



අප්‍රිකානු වනාන්තර අලියා

නමුත් මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකානු අලියා පිළිබඳව ය. ශ්‍රී ලාංකීය සමාජය තුළ අලි ඇතුන් මෙල්ල කිරීම හා ඔවුන්ගෙන් සේවය ගැනීම ආදී රාජකාරී පැවරුණු සමාජ කොට්ඨාසය අයත් වූයේ "දූර" යන කුලයටය. ඒ අනුව "පන්නදූර" යනු ඇත් ගොව්වන්ය. ඔවුන් අලි ඇතුන් අල්ලා මෙල්ල කොට සුදුසු පරිදි චාරිත්‍රානුකූලව ආගමික හා සංස්කෘතික සන්දර්ශන හා පෙළපාලි වෙනුවෙන් සහභාගී කරවති. "Sinhala literature of the 3rd Century BC indicates that the state elephant or Mangalahatti was the elephant on which the king rode. This elephant was always a tusker and had a special stable called the hatthisala. The post to which it was tethered was called the alheka." (Jayawardhena, Living Heritage Magazine) ඒ අනුව රජු ගමන් කරනු ලබන්නේ "මංගල හස්තියා" කර මතය. එම මංගල හස්තියා වාසය කරන ස්ථානය "හස්තිසල" වන අතර මංගල හස්තියා ගැටලසමින් ආවතේව කරන තනතුර "අල්හක" ලෙස නම් කර තිබුණි.

"හස්ති, ගජ" යන නම්වලින් අලියා හඳුන්වන අතර වැදි ජනවහර තුළ "බොටකඳා" ලෙස දක්වයි. මහාචාර්ය සිරිල් රණවැල්ලට අනුව "වැරි" යනු දළ සහිත හස්තීන් හැඳින්වීමට සෙල්ලිපිවල යොදාගත් නමකි. මහාචාර්ය සෙනරත් පරණවිතාන "වැරියන්" ලෙස හඳුන්වා ඇත්තේ කම්කරුවන් ලෙස ඇත් ගොව්වන් විය හැකිය. නමුත් මෙම භාවිතයන් සාකච්ඡාවට ලක් වූ වචන වේ.

ශ්‍රී ලංකාවේ සිට අලි ඇතුන් අපනයනය කිරීම ද සිංහල රජ දවස සිදු කර ඇත. විශේෂයෙන්ම ඉන්දියාව, මියන්මාරය වැනි රටවල් මෙහිදී ප්‍රධාන කොට දැක්විය හැකිය. ඇතැම් අවස්ථාවලදී මිළ මුදල් හෝ රන් රිදී වෙනුවෙන් ද තවත් විටෙක තෑගී වශයෙන් ද මෙලෙස අලි ඇතුන් හුවමාරු වී ඇත.

ඒ අනුව සංස්කෘතික පදනමක් මත පිහිටා අලියා හෝ ඇතා යනු ආරක්ෂා කළ යුතු සතෙක් ලෙස සිංහල රජ දවස පිළිගෙන ඇත. එම නිසා රාජකීය අඥාවන් මගින් අලි ඇතුන් ආරක්ෂා කිරීම සඳහා සිංහල රජවරු කටයුතු කර ඇත. අලි ඇතුන් ඝාතනය කිරීම මරණීය දණ්ඩනය ලැබිය හැකි වරදකි. නමුත් මෙම සම්ප්‍රදාය හා නීතිය යටත් විජිත පාලන සමය තුළ යම්තාක් දුරට ලිහිල් විය.

**මූර්ති හා කැටයම් කලාව තුළ අලි ඇතුන්**

මේ කෙසේ වෙතත් අලි ඇතුන් මිනිසා, සංස්කෘතිය හා ආගම අතර පැවතියේ අවියෝජනීය සබඳතාවකි. ශ්‍රී ලාංකීය පුරාණ නටබුන්, ආගමික වෙහෙර විහාර හා වතාවත් මිනිසා හා අලි ඇතුන් අතර පැවති අපූර්ව සබඳතාව පැහැදිලි කරයි. විවිධාකාරයේ කැටයම්, මූර්ති ආදිය මගින් එයට කලාත්මක පිළිබිඹුවක් එක් කර ඇත. සඳකඩ පහණේ ඇත්, අශ්ව, සිංහ හා ගව පෙළකින් යුක්ත කැටයම් දැකිය හැකි පොළොන්නරු සඳකඩ පහණේ ඇතුන්ගේ රූප සටහන් සහ ඉනික්බිතිව අශ්වයන්ගේ රූප සටහන්ද නිර්මාණය කිරීම සිදු විය. "පොළොන්නරු යුගය වන විට සඳකඩ පහණේ අන්තර්ගත කැටයම්වල යම් යම් වෙනස්කම් ද දක්නට ලැබේ. හින්දු ආගමේ බලපෑම හේතුකොටගෙන ගව රූපය සඳකඩ පහණෙන් ඉවත් විය. අනුරාධපුර යුගයේ සඳකඩ පහණේ ඇතා අශ්වයා යන සතුන් එකම තීරුවක කැටම්කර තිබුණත්, පොළොන්නරු යුගයේ සත්ත්ව රූප වෙන් වෙන් තීරුවල කැටයම් කර ඇත. එහිදී ගල් බිංදු, හංස පන්තිය, ඇත් රූප, අශ්ව රූප, විවෘත පද්මය පිටත සිට ඇතුළට පිළිවෙලින් කැටයම් කර ඇත"(ගමගේ 2008). පොළොන්නරු යුගයේදී යම් යම් වෙනස්කම්වලට ලක්ව ඇතත් ඇත් රුව සහිත කැටයම් කිසිදු වෙනසකට ලක්වී නොමැත.





එමෙන්ම මුරගලට පිටුපසින් දක්නට ලැබෙන කොරවක් ගලද කාලයක් සමග කැටයම්වලින් අලංකාර විය. මුල්ම අවධියේ කොරවක් ගල ද කැටයම්වලින් තොර විය. පසු කාලයේ එකතු වූ කැටයම් සහිත රටාවන් නිසා මෙය අත්වැටක් ලෙස සැලකිය හැකිය. "කොරවක් ගලේ සරලම අවස්ථාවේ තිබූ අත් වැටක ලීස්තර සහිත කොටස ක්‍රමයෙන් ඇත් සොඬ ආකාර ගත් බව පැහැදිලිව දක්නට ලැබේ"(නාගොඩවිතාන 2013).

වාහල්කඩ වූ කලී ශ්‍රී ලංකීය කලා කරුවාගේ කලා කෞශල්‍යය මනාව පිළිඹිබු කරන තවත් කලා නිර්මාණයකි. වාහල්කඩ දෙපසෙහි තනි කළු ගලින් නිම කළ උස කණු දෙක බැගින්ද ඒ දෙපස පිහිටි මිටි ගල් කණු දෙක බැගින්ද පිහිටුවා ඇත. ඇතැම් තැනක උස කණුව මදුණේහි ගලින් නෙළන ලද සිංහ රූපයක් හෝ ඇත් රූපයක් සවි කොට ඇත. මේ අනුව පැති හතරේම උස කණු මත ඇත්, අස්, සිහ හා ගව රූප සවිකොට තිබෙන්නට ඇත. කණු මුදුණේහි කොටස් කිහිපයකිට බෙදා එක් කොටසෙහි ඇතුන්, පැටවුන් සහිත මොණරෙක්, ජය කොන්තය, පුන්කලස විහිදෙන ලියවැලක් වැනි කැටයමින් සරසා ඇත. ලියවැලෙහි හිස් තැන් තුළ ඇත්, සිංහ, මිනිස් හා කුරුලු රූප කැටයම් කර ඇත.

"This piece of animal sculpture is probably unique in Ceylon. Cut in full round from a rock, life-size, are the head and shoulders of an elephant whose feet the river washed when low. The elephant stands in the water, looking slightly upstream, as though hesitating to cross. At present the river in semi-flood reaches its eyes. There are signs of 'sets' for some building's foundations on a boulder adjoining, but no ruins or inscriptions are known likely to afford a clue to the object of this solitary tour de force of a skilful sculptor," (Bell & Bell 1893). මහවැලි ගං ඉවුරේ සකස් කර තිබුණු මෙවැනි ගල් පුවරු හා මූර්ති මේ වන විට මසුන් මරන්නන්ගේ ඩයනමයිඩ් ප්‍රහාර නිසා විනාශ වි ඇත.


සිංහල රජ දවස ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය වූයේ ද අලි හෝ ඇතුන්ය. අලියා පිට ගාම්භීරව ගමන් කරන්නේ රාජකීය පවුලේ ඇත්තන්ය. පරාක්‍රමබාහු රජතුමා නැවත සිංහාසනයට කැඳවාගෙන ඒමට මූලික වී ඇත්තේ ද රාජකීය අලියාය. දුටුගැමුණු රජතුමාගේ කඩොල් ඇතාව ද මහාවංසයේ සුවිශේෂී කොට දක්වා ඇත.

මුල් කාලීන සිංහල සමාජය තුළ අලි සටන් හඳුන්වන ලද්දේ "ගජ කෙළිය" ලෙසය. මෙයට රාජ තාන්ත්‍රික අනුග්‍රහය ලැබුණු අතර ප්‍රධාන වශයෙන් සිංහල අවුරුදු සමයේ ප්‍රචලිත විය. "In this country too elephants have fought in wars and featured in various sports and combat during Sinhala celebrations. In India they have provided transportation for sportsmen indulging in shikars" (Jayawardhena, Living Heritage Magazine).

අනෙක් අතට යුද උපක්‍රමයක් ලෙස ද භාවිතා වන අලියා චතුරංගනී සේනාවට ද අයත්ය. එමෙන්ම ආරක්ෂක හා දඬුවම් මෙවලමක් ලෙස ද අලි හා ඇතුන් භාවිතා කර ඇත. ඇතුන් ලවා පාගවා මරණිය දණ්ඩනය ලබාදීම සිංහල රජ දවස දරුණුතම දඬුවමකි.

### දළදා පෙරහැර තුළ අලි ඇතුන්

පොළොන්නරු රාජධානි සමයේදී නිශ්ශංක මල්ල රජු අලි සටන් නරඹමින් විනෝද වූ ආකාරය 12 වන සියවසේ ශිලා ලේඛනවල සඳහන් වේ. ශ්‍රී ලාංකීය බෞද්ධ සමාජයේ මුදුන්මල්කඩ ලෙස සළකන දළදා පෙරහැර සඳහා ද අලි ඇතුන් යොදාගත්තේ මහත් හරසරින් ය. එය වර්තමානයේද භාවිතා වන අතර දළදා පෙරහැරට අමතරව වෙනත් සෑම පෙරහැරකම අලි ඇතුන් යොදාගැනීම සම්ප්‍රදායක් බවට පත්ව ඇත.



ඉතා මනරම් ආකාරයෙන් සරසන ලද අලි ඇත්තු වැඩිම ප්‍රමාණයක් සහභාගීවන පෙරහැර වන්නේ දළදා පෙරහැරයි. අලි ඇතුන් හිමි කරුවන් දළදා පෙරහැරට අලි ඇතුන් එකතු කරන්නේ මහත් හරසරිනි. එහිදී දළදා පෙරහැරේ අති පූජනීය වස්තුව ලෙස සලකන කරඬුව වැඩම කරවීමේ භාග්‍ය හිමිවන්නේ මංගල ලක්ෂණ සහිත හස්තියෙකුට පමණි. "මංගල හස්ති රාජයෙකුට භූමි ස්පර්ෂ ස්ථාන හතක් හෙවත් හත්පොළ වැඳුම් පිහිටා තිබීම අනිවාර්ය වේ. එම ස්ථාන වන්නේ සතර පා, ඇත් හොඬ, වලිගය හා ලිංගයයි. ඊට අමතරව මඟුල් ඇතෙකු සතු තවත් ගුණාංග රාශියක් පවතී. එනම් පුළුල් පිට, පුළුල් කුඹුතල, උදාර ලීලාව, තේජාන්විත දළ යුවල හා මනා කීකරුකමය. කරඬුව වැඩම කරවීමේ සුදුසුකම ලත් ඇතු තෝරාගැනීමේදී දළදා මාළිගාවේ ගජනායක නිළමේ, කාරිය කෝරාල සහ ඇතුන් පිළිබඳ කටයුතු කරන සියලු දෙනා සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹීම සාමාන්‍ය සම්ප්‍රදායයි. මෙම සියලු ගුණාංග සපිරු නියාවෙන් කරඬුව තම පිට මස්තකයේ තබාගෙන පාවඩ මතින් උඩු වියන් යටින් ජනතා පූජෝපාහාර මැද ගමන් කිරීමේ වාසනා මහිමය හිමි වූ ඇතුන් අතර දළදා මාළිගාවේ රාජා, මිල්ලන්ගොඩ රාජා හා හෙයියන්තුඩුව රාජා යන ඇතුන් තිදෙනා සුවිශේෂීය" (අරුණසිරි 2015).

මහනුවර රජ දවස අලි ඇතුන් ඇල්ලීම, හීලෑ කිරිම, පුහුණු කිරීම ආදිය විශේෂ කොට සලකන ලදී. රාජතාන්ත්‍රික වශයෙන් එම කටයුතු පැවරුනේ "ගජනායක" නිළමේවරුන්ටය. මෙම ගජනායක නිළමේවරු ඉහළ කුලයට අයත්වන අතර රාජකීය වරප්‍රසාද බොහෝමයක් බුක්ති වින්දෝය. මේ අනුව පෙනීයන්නේ ඇතා මෙන්ම අලියා ද සිංහල සංස්කෘතිය සමඟ ප්‍රබලව බැඳී ඇති බවයි. එයට ප්‍රධාන හේතුවක් ලෙස සද්දන්ත ශරීරය මෙන්ම මහේශාඛ්‍ය ගමන් විලාසයත් රූපකායත් විය හැකිය. එම නිසාම උඩරට නැටුම් සම්ප්‍රදායේ "ගජගා" වන්නමෙන් කියවෙන්නේ මෙකී ඇතාගේ ගමන් විලාසයයි.

ගමන් යනෙන සොඳ රූබර තාලෙට ඇත් රජ ගමනෙදි යන්නේ
පවන් සලන සොඳ කන්පොතු සලමින් දෑලේ මිනි නද දෙන්නේ
බලන්න පුදුමයි ගමනට මිනි නද එකින් එකට වැඩි වන්නේ
අහන්න මැතිඳුනි ගජගා වන්නම මේ ලෙසටයි පවතින්නේ
(ගජගා වන්නම)

**සිංහල ජන සමාජය තුළ අලි ඇතුන්**

සිංහල ජන සමාජය තුළ අලියා යනු ගෞරව සම්පන්න සතෙකි. නමුත් කෘෂිකාර්මික කටයුතුවලදී ඔහු කරදරකාරී සතෙකි. එම නිසාම අලියා එලවන මන්තර හෝ අලි හීලෑ කරගන්නා මන්තර සිංහල ගැමියා කාලාන්තරයක් තිස්සේ ප්‍රගුණ කර ඇත. ඒ සඳහා විශේෂ කෙම් ක්‍රම ද භාවිතා වී ඇත.

සිංහල ජන වහර තුළ අලියා හා ඇතා සම්බන්ධ බොහෝ උපමා කතා, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු හා ඉඟිවැකි පවති. ගමරාල අලියාගේ නැට්ටේ එල්ලී දිව්‍යලෝකේ ගිය හැටි සරල උපමා කතාවකි.

බීරි අලියාට වෙණ වයන්නා සේ,
අලි හක්කේ පොල් ගෙඩිය තියාගත්තා සේ,
ඇතුන් යන පාරේ හතු පිපෙන්නාක් වගේ,
ඇතා වැහැරුන්ත් කොරහේ නාවන්න බෑ වාගේ,
පෙරහැරේ යන අලි කොටන් අදින්නේ නැතුවා වාගේ,
අන්ධයා අලියාගේ හැඩ කිව්වා වාගේ
ගිය නුවණ ඇතුන් ලවාවත් ඇද්දවිය නොහැක්කා සේ, ..................

ආදී වශයෙන් සිංහල ජනවහර පෝෂණය කර ඇත. එපමණක් නොව පන්සිය පනස් ජාතක පොත, සුභාෂිතය, ගුත්තිල කාව්‍ය, නාලාගිරි දමනය, මහාවංසය ආදී චූල ග්‍රන්ථ සෑම එකකම පාහේ අලි ඇතුන් පිළිබඳ විවිධාකාරයෙන් සටහන් වී ඇත. එමෙන්ම මහමයා දේවිය සිහිනෙන් දුටුවේ සුදු ඇත් පැටවෙකි. අනෙක් අතට බොහෝ දෙවිවරුන්ගේ වාහනය වන්නේ ද අලි ඇතුන්ය. සමන් දෙවියන්ගේ සුදු ඇතා සිරිපා අඩවියේ තවමත් විරාජමානව සිටි. අයියනායක දෙවියන්ගේ වාහනය වන්නේ ද ඇතෙකි.

එමෙන්ම අලි වෙනුවෙන් වෙන් වූ භාෂාවක්ද නිර්මාණය වී ඇත. මෙම භාෂාව හඳුන්වනු ලබන්නේ අලි භාෂාව ලෙසය.

දෙරි තෙත්තන්- අරගෙන පස්සට පලයන්
අලියා දෙරි - ගනින්

අලියා හිද - නිදාගනින්

මොහො දහ - මේ පැත්තට වරෙන්

අලියා පුරු - පෙරළෙන්න

අලියා දහ ඉඩ - අයින්වෙලා පලයන්

අලියා පුරු උදාරි - හොඬය අස්සා තල්ලු කරපන්

අලියා හරුව - විසි කරපන්

අලියා බිලමා - පාගපන්

අලියා පිචන් - නිකා හිටින්

අලියා දන - දන ගහපන්

අලියා දහ - යමන්

අලියා හෝවා - නැවතියන්

අලියා බිල බිමල පුරු - කකුළ උස්සපන් ……..

ආදී ලෙස දැක්විය හැකිය.

මේ අනුව සලකා බලන විට අලි ඇතුන් පිළිබඳ පිටු ගණන් විවිධ දිශානතීන් ඔස්සේ සාකච්ඡා කළ හැකිය. එසේ වන්නේ ශ්‍රී ලාංකීය සිංහල සංස්කෘතිය හා සමාජය තුළ අලි ඇතුන්ට හිමි ස්ථානයේ ප්‍රබලතාවය මතය. එබැවින් අලි ඇතුන් යනු අප විසින් ආරක්ෂා කළ යුතු සත්ත්ව කොට්ඨාසයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


දර්ශනපති ප්‍රභාත් ගමගේ, බෞද්ධ කලාවේ අපූර්ව නිර්මාණ, බුදුසරණ, 2008.10.21

බුද්ධි නාගෝඩවිතාන, මුරගල හා මකර කොරවක්ගල කලා කෘතිවලින් මතුකෙරෙන නිර්වානයේ දොරටුව, දිවයින, බදාදා අතිරේකය, 2013.10.09

උදේනි අරුණසිරි, එදා දළදා පෙරහැරට කැපවුණු ඇත්තු මෙදා වී ඇත් කෞතුක වස්තු, දිවයින, බදාදා අතිරේකය,2015.08.26

ජගත් කණහැර ආරච්ච, ආසියානු අලියා, දිවයින ඉරිදා සංග්‍රහය,2013.10.13

Jayantha jayawardhana, Elephants in Sri Lankan History and Culture, Living Heritage magazine